# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2456/03 – 2025 සැප්තැම්බර් මස 29 වැනි සඳුදා – 2025.09.29**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පරිපාලන සීමාවන් තුළ ඇති ප්‍රදේශවල ප්‍රාදේශික කාරක සභා සමග ක්‍රියාත්මක වන ප්‍රාථමික සමුපකාර සමිතිවල ලියාපදිංචි කරන ලද අතුරු ව්‍යවස්ථා විධිවිධානවලට අනුකූලව ප්‍රාදේශික කාරක සභා තෝරා ගැනීම සඳහා සකස් කරන ලද නියෝග

උතුරු පළාතේ පරිපාලන සීමාවන් තුළ ක්‍රියාත්මක වන සීමා සහිත විවිධ සේවා සමුපකාර සමිති, තල් සහ පොල් සංවර්ධන සමුපකාර සමිති සහ ප්‍රාදේශික කාරක සභා ක්‍රියාත්මක වන අනෙකුත් ප්‍රාථමික මට්ටමේ සමුපකාර සමිති විසින් ලියාපදිංචි කර ඇති අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් නඩරාජා තිරුලිංගනාදන් වන මම, 1977.12.28 දිනැති අංක 297/7 සහ 1998.5.19 දිනැති අංක 1028/06 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රාදේශික කාරක සභා තෝරා ගැනීම සඳහා වන නියෝග 2025.08.15 දින සිට බලපැවැත්වෙන පරිදි උතුරු පළාතේ බල ප්‍රදේශය තුළ බල නොපැවැත්වෙන බව මෙයින් ප්‍රකාශ කරමි. ඒ වෙනුවට, පහත දක්වා ඇති නීති 01 සිට 24 දක්වා 2025.08.15 දින සිට බල පැවැත්වෙන පරිදි බලාත්මක වේ.

**එන්. තිරුලිංගනාදන්,**
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්,
උතුරු පළාත,
යාපනය.

1. **ලුහුඬු නාමය**
   සීමා සහිත විවිධසේවා සමුපකාර සමිති, තල් සහ පොල් සංවර්ධන සමුපකාර සමිති සහ උතුරු පළාත තුළ ක්‍රියාත්මක වන ප්‍රාදේශික මහ සභා සහිත ප්‍රාථමික සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභා නියෝජිතයින් තෝරා ගැනීම සඳහා වන නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. ප්‍රාදේශික කාරක සභා නියෝජිතයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් කලින් කලට නිකුත් කරන ලද උපදෙස් වලට අනුකූලව ප්‍රාදේශික කාරක සභා සහිත සමිති සාමාජිකයින්ගේ නාම ලේඛනය සම්පූර්ණ කර ප්‍රාදේශික කාරක සභා නියෝජිතයින් තෝරා පත් කර ගත යුතුය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. ප්‍රාදේශික කාරක සභා නියෝජිතයින් තෝරා පත් කර ගැනීම සඳහා කොමසාරිස්වරයා විසින් නම් කරන ලද නිලධාරියා ප්‍රාදේශික මහ සභා රැස්වීම කැඳවීමට බලයලත් පුද්ගලයා විය යුතුය.

4. 1992 අංක 11 දරන පනත (සංශෝධනය) සහ 1983 අංක 32 දරන පනත (සංශෝධනය) මගින් සංශෝධනය කරන ලද 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 11ආ. වගන්තියට අනුකූලව, ප්‍රාදේශික මහා සභා රැස්වීමට සහභාගී වී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති සාමාජිකයින්ට 3 වන වගන්තිය යටතේ බලය පවරන ලද නිලධාරියා විසින් ප්‍රාදේශික මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම යැවිය යුතුය.

5. ප්‍රාදේශික මහා සභා රැස්වීමක් සඳහා සණපූරණය ප්‍රාදේශික මහා සභා රැස්වීමට සහභාගී වී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති මුළු සාමාජිකයින්ගෙන් හතරෙන් එකක් හෝ 25 කි. එයින් අවමය සණපූරණය විය යුතුය.

6. ප්‍රාදේශික මහා සභා රැස්වීමට සහභාගී වී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති සාමාජිකයින්ගේ නම් සමිතියේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රදර්ශනය කළ යුතුය. මෙම නාම ලේඛනය අදාළ සමුපකාර සමිති අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති පරිදි ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති සාමාජිකයින්ගේ නාමලේඛනය ලෙසද සැලකේ.

7. ප්‍රාදේශික මහා සභා රැස්වීම් පවත්වන ස්ථානය සහ වේලාව කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන අතර, 6 වන වගන්තියේ දක්වා ඇති සාමාජිකයින්ගේ නාමලේඛනයට අනුව එක් එක් සාමාජිකයාට ඒ පිළිබඳව ලිඛිතව දැනුවත් කළ යුතුය.

8. කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන ස්ථානයේ සහ වේලාවට අනුව 3 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ නිලධාරියා විසින් ප්‍රාදේශික මහ සභාව කැඳවිය යුතු අතර, සභාපති ලෙස එම රැස්වීමේදී ප්‍රාදේශික කාරක සභාව තෝරා පත් කර ගැනීමට අදාළ ක්‍රියා පටිපාටි පැහැදිලි කළ යුතු අතර, 9 වන වගන්තියේ දක්වා ඇති පරිදි තෝරා පත් කර ගැනීම් කළ යුතුය.

9. ලියාපදිංචි කළ අතුරු ව්‍යවස්ථාවට අනුකූලව, අවම වශයෙන් වයස අවුරුදු 18 ත් 35 ත් අතර පුද්ගලයින් දෙදෙනෙකු ඇතුළුව, අදාළ ප්‍රාදේශික මහා සභාවෙන් ප්‍රාදේශික කාරක සභාවට සාමාජිකයින් තෝරා පත් කර ගන්නා ලෙස සභාපතිවරයා විසින් මහා සභාවට පවසා සිටිය යුතුය. තවද, ප්‍රාදේශික කාරක සභාවට කාන්තාවන් පත් කර ගැනීම් සඳහා එම සමිතියේ අතුරු ව්‍යවස්ථාවල කෙසේ සඳහන් වුවත් ප්‍රාදේශික මහ සභා රැස්වීමට සහභාගි වන සාමාජිකයින්ගෙන් සෘජුවම කාන්තාවන් තෝරා පත් කර ගත යුතුය. මෙසේ අනෙකුත් තෝරා ගැනීම් සිදු කළ යුතු අතර අනෙකුත් බාණ්ඩවල නියෝජිතයින් තෝරාගැනීම් සිදු නොවුයේ නම් එය පුරප්පාඩුවක් බව ප්‍රකාශ කළ යුතුය.

10. සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවලට අනුව, එක් එක් බාණ්ඩයෙන් තෝරා පත් කර ගත යුතු සංඛ්‍යාවට වඩා ප්‍රාදේශික මහා සභාවෙන් යෝජනා ඉදිරිපත් වුවේ නම්, සභාපතිවරයා විසින් රහස් ඡන්දයක් පැවැත්විය යුතුය. සභාපතිවරයා රහස් ඡන්දයෙන් මැතිවරණය පැවැත්වීමට තීරණය කළ පසු, මහ සභාවෙන් ඉදිරිපත් වන වෙනත් යෝජනා තිබේ නම් ඒවා ප්‍රතික්ෂේප කළ යුතුය.

11. රහස් ඡන්දය පැවැත්වීම සඳහා වන විධිවිධාන -

(i) අපේක්ෂකයින්ගේ නම් යෝජනා කළ අනු පිළිවෙලට ප්‍රදර්ශනය කළ යුතුය.
(ii) යෝජනා කරන ලද අපේක්ෂකයින් සඳහා ඡන්ද පත්‍රිකාවක් මගින් අංක ලබා දිය යුතුය.
(iii) එක් එක් බාණ්ඩය සඳහා තෝරා ගැනීම සිදු කරන්නේ නම් සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව සුදුසු පරිදි වෙනම ඡන්ද පෙට්ටි භාවිතා කළ යුතුය.

12. පවත්වන ලද රහස් ඡන්දයෙන් සාමාජිකයින් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් සමාන ඡන්ද ලබා ගන්නේ නම්, අවශ්‍ය වන පරිදි නියෝජිතයෙකු හෝ වැඩි ගණනක් තෝරා ගැනීම සඳහා සභාපතිවරයා විසින් කුසපත් ඇදිය යුතුය. සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබා ඇති අපේක්ෂකයින් තෝරා ගන්නා ලද අපේක්ෂකයින් සමග ගළපන අවස්ථාවක දී තෝරා පත් කර ගත යුතු අපේක්ෂකයින්ගේ ගණනට වඩා වැඩි නොවන අවස්ථාවක එවැනි කුසපත් ඇදීමක් අවශ්‍ය නොවේ.

13. රැස්වීමට පැමිණ සිටින සාමාජිකයින්ට ප්‍රාදේශික කාරක සභා තෝරා පත් කර ගැනීමට පහත සඳහන් කරුණු තුන සම්බන්ධයෙන් ලිඛිතව විරෝධතා ඉදිරිපත් කළ හැකිය:

(i) සමිතියේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව ප්‍රාදේශික කාරක සභාවේ නියෝජිතයෙකු ලෙස තේරී පත් වීමට නුසුදුසු පුද්ගලයෙකු බව පෙනී ගියහොත්.

(ii) ප්‍රාදේශික කාරක සභාවේ නියෝජිතයෙකු ලෙස තේරී පත් වූ පුද්ගලයාගේ හෝ යෝජනා කරන්නාගේ හෝ ස්ථිර කරන්නාගේ නම ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ඇති සාමාජිකයින්ගේ නාම ලේඛනයේ නොමැති නම්.

(iii) ප්‍රාදේශික කාරක සභා නියෝජිතයින් තෝරා ගැනීමේදී සාමාජිකයින්ගේ නාම ලේඛනයේ නම සඳහන් පුද්ගලයෙකු රැස්වීමට නොපැමිණියේ නම් සහ ඔහු ලෙස පෙනී සිටිමින් වෙනත් පුද්ගලයෙකු ප්‍රාදේශික කාරක සභාවේ සාමාජිකයෙකු ලෙස තේරී පත් වී සිටී නම්.

14. 13 වන වගන්තියේ (i), (ii) සහ (iii) යන උප වගන්ති යටතේ ඉදිරිපත් කරන ලද විරෝධතා වලින් (ii) සහ (iii) සලකා බැලීමට සහ තීරණය කිරීමට සභාපතිවරයාට බලය ඇත. කෙසේ වෙතත්, (i) උප වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඕනෑම විරෝධතාවක් සම්බන්ධයෙන්, එම විරෝධතාව අවසාන තීරණය සඳහා කොමසාරිස්වරයා වෙත යොමු කරන බව සභාපතිවරයා මහ සභාවට දැනුම් දිය යුතු අතර තෝරා ගැනීම් ක්‍රියාවලිය ඉදිරියට පවත්වා ගෙන යා යුතුය.

15. රහස් ඡන්දය ආරම්භ කිරීමට පෙර සහ ඡන්දයක් නොපවත්වන අවස්ථාවක දී නම් ප්‍රාදේශික කාරක සභා නියෝජිතයින්ගේ නම් සභාපතිවරයා විසින් මහා සභාවට නිවේදනය කිරීමට පෙර ඉහත විරෝධතා සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

16. ප්‍රාදේශික කාරක සභා තෝරා ගැනීමේදී ඡන්දයක් පැවැත්විය යුතු යැයි සභාපතිවරයා විසින් තීරණය කරන අවස්ථාවන්හිදී, රැස්වීමට සහභාගී වීමට සුදුසුකම් ඇති සාමාජිකයින්ගේ පැමිණීම සැලකිල්ලට ගත යුතු අතර, ඡන්දය ආරම්භ කිරීමෙන් පසු රැස්වීමට සහභාගී වීමට සුදුසුකම් ඇති සාමාජිකයින්ගේ පැමිණීම රහස් ඡන්දය පැවැත්වීම කෙරෙහි කිසිදු ආකාරයකින් බල නොපායි.

17. ප්‍රාදේශික කාරක සභා තෝරා ගැනීමේදී සභාපතිවරයා විසින් ඡන්ද පෙට්ටියේ ඡන්ද ගණන් කිරීම ආරම්භ කළ යුතුය.

(i) ඡන්ද විමසීමේදී සිටින සාමාජිකයින් සංඛ්‍යාව ඡන්ද පෙට්ටියේ ඇති ඡන්ද පත්‍රිකා ගණනට සමාන විය යුතුය.

(ii) සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුව, එක් එක් කාණ්ඩය සඳහා තෝරා පත් කර ගත යුතු සංඛ්‍යාවට වඩා වැඩි අපේක්ෂකයින් සඳහා සලකුණු කර ඇති ඕනෑම ඡන්ද පත්‍රිකාවක් සභාපතිවරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතුය

(iii) ඡන්ද පත්‍රිකාවේ ලකුණු කර ඇති ඡන්දය කුමන අපේක්ෂකයා හට යන වග පැහැදිලි නොවන අවස්ථාවක සභාපතිවරයා විසින් එම ඡන්දය අවලංගු කළ යුතුය.

(iv) සමාජිකයෙකු විසින් ඡන්ද පත්‍රිකාවේ එක් අපේක්ෂකයෙකුට මනාප එකකට වඩා ලකුණු කර ඇති අවස්ථාවක එවැනි සියලුම මනාප එක් ඡන්දයක් ලෙස ගණනය කළ යුතුය.

(v) ප්‍රතික්ෂේප නොකළ ඡන්ද පත්‍රිකා සභාපති වරයා විසින් තහවුරු කර ඡන්දය ගණන් කර ලකුණු කිරීමේ පත්‍රිකාව පදනම් කරගෙන ඡන්ද ගණන් කළ යුතුය.

18. ඡන්දය ගණන් කිරීමෙන් පසු සභාපතිවරයා විසින් ප්‍රාදේශික කාරක සභාවට තේරී පත් වූ නියෝජිතයින්ගේ නම්, ප්‍රාදේශික කාරක සභාවට අයත් මහ සභාවට ප්‍රකාශ කළ යුතු අතර සමිතියේ ලේකම් වෙත සහ කොමසාරිස්තුමා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

19. ප්‍රාදේශික කාරක සභා තෝරා ගැනීම් සිදු කළ පසු සමිතියේ ලේකම් විසින් ප්‍රාදේශික කාරක සභාවට තේරී පත් වූ නියෝජිතයින්ගේ නම් සමිතියේ ද උක්ත ප්‍රාදේශිකයේ ද තෝරා පත් කර ගැනීම් සිදු කළ ස්ථානයේ ද දැන ගැනීම සඳහා ප්‍රදර්ශනය කළ යුතුය.

20. ඡන්දය පැවැත් වූ ආකාරය සම්බන්ධයෙන් පැන නගින ඕනෑම ප්‍රශ්නයක් ගැන කොමසාරිස්වරයාගේ තීරණය අවසාන මෙන්ම තීරණාත්මක ද විය යුතුය.

21. සමිතියේ ප්‍රාදේශික කමිටුවක් තෝරා පත්කර ගැනීම සම්බන්ධ සියලු වියදම් සමිතිය විසින්ම දැරිය යුතුය.

**22.** අර්ථ නිරූපණය

(i) 3, 7, 8 සහ 18 වගන්තිවල සඳහන් " කොමසාරිස් " යන පදය සමුපකාර සංවර්ධන කොමසාරිස්, උතුරු පළාතේ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් සහ සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් අදහස් කරනු ලැබේ.

(ii) 2, 14, 20 සහ 23 වගන්තිවල සඳහන් " කොමසාරිස් " යන පදය සමුපකාර සංවර්ධන කොමසාරිස්, උතුරු පළාතේ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් අදහස් කරනු ඇත.

(iii) "අපේක්ෂකයා" යන පදය ඡන්දයක් සඳහා යෝජනා ස්ථිර කරන ලද සාමාජිකයින් අදහස් කරනු ලැබේ.

(iv) " අතුරු ව්‍යවස්ථාව" යන පදය සමුපකාර සමිතියක ලියාපදිංචි අතුරු ව්‍යවස්ථා සහ කොමසාරිස් විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා ඕනෑම සංශෝධනයක් අදහස් කරනු ලැබේ.

23. මෙම නියෝග අර්ථ නිරූපණය සම්බන්ධයෙන් කිසියම් ආරවුලක් ඇති වුවහොත්, කොමසාරිස්වරයාගේ තීරණය අවසාන මෙන්ම තීරණාත්මක ද වනු ඇත.

24. මෙම නියෝග වලින් දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට දෙමළ භාෂාව බලපැවැත්වේ.

EOG 09 - 0242

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.